# කර්ණාටක සංගීතය

## විෂය නිර්දේශය

## 06 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# හැඳින්වීම

පාසල්වල පවතින සෞන්දර්ය විෂයයයන් අතරට කර්ණාටක සංගීතය ද විෂයක් ලෙස එක් කර ඇත. කණිෂ්ඨ අංශයේ ඉගෙනුම ලබන සිසුහු බොහෝ දෙනෙක් මෙම විෂය තෝරා ගනිති. රසවින්දනය, නිර්මාණශීලී බව, ප්‍රාසාංගික බව, පූර්ණත්වයට පත්කිරීමට කර්ණාටක සංගීතයෙන් ඉටු කෙරෙන සමාජීය මෙහෙවර ගැන සඳහන් කළ යුතුයි. ශිෂ්‍යයකුගේ පෞරුෂ වර්ධනයට කර්ණාටක සංගීතය පිළිබඳ දැනුම ඉතා වැදගත් වේ. 2012 වර්ෂය තුළ සිදුකරන ලද විෂය නිර්දේශ සංශෝධනයේ දී පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- ක්‍රියාත්මක ව පවතින නිපුණතා හා නිපුණතා මට්ටම්
- කර්ණාටක සංගීතය ඉගැන්වීමේ කටයුතුවල නිරත ව සිටින ගුරු භවතුන්ගෙන් ලබා ගත් යෝජනා
- විභාගවල දී අවධානය යොමු කළ යුතු කරුණු

කර්ණාටක සංගීතය උගන්වන ගුරුභවතුන්, සම්පත් පුද්ගලයින්, උපදේශකවරුන් විසින්, දැනට ක්‍රියාත්මක වන විෂය නිර්දේශයේ සමහර විෂය කොටස් නියමිත කාලච්ඡේද තුළ උගන්වා නිම කළ නොහැකි වීමේ අඩුපාඩුව පෙන්වා දෙන ලදී. මේ නිසා සමහර විෂය කොටස් ඉවත් කිරීමට සිදුවිය. තව ද මෙම විෂයට අදාළ නිපුණතා පහේ ම මේ දක්වා තිබුණු ක්‍රියාකාරකම්වල ද සමහර වෙනස්කම් සිදුකරන ලදී. උදාහරණයක් ලෙස ගත්විට ක්‍රියාකාරකම්වල තිබූ සමහර 'උරුප්පඩි' වෙනුවට ඇතැම් අලුත් 'උරුප්පඩි' පත් කරන ලදී. එසේ ම ශිෂ්‍යයින්ට ස්වර පිළිබඳ ඥානය ලබාදීම සඳහා 'ස්වර කොරවෙ' නිර්මාණය කර ගායනා කිරීමේ විෂය කොටස් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යටතට අලුතින් එක් කර ඇත.

''වාක්කේයක්කාරේ ඉතිහාසය'' නැමැති කොටස මේතාක් කල් දැනුම හා සම්බන්ධ නිපුණතාව තුළ පැවති අතර එය, සංස්කෘතික පසුබිමට අදාළ නිපුණතාවට සුදුසු බැවින් එහි එක් කර ඇත. 6-9 ශ්‍රේණිවල කර්ණාටක සංගීතය ඉගෙනගත් විෂය කරුණු සිසුන් 10-11 ශ්‍රේණිවල ද ඉගෙනගැනීම අවශ්‍යයයි.

විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් කර්ණාටක සංගීතය ඉගෙනීමට පෙළඹවීම පිළිගත හැකි බවට බලාපොරොත්තු වේ. මෙම විෂය නිර්දේශය විෂය නිපුණතාවන් කරා ළඟාවීමට මඟ පෙන්වන බවට විශ්වාස කරමු.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## කර්ණාටක සංගීතයේ විෂය අරමුණු

1. කර්ණාටක සංගීතය පිළිබඳ දැනුම, කුසලතා, ආකල්ප දියුණු කර ගනියි.
2. පරිසරය හා බැඳී සංගීතය රසවිඳීමේ හැකියාව ලබයි.
3. නිර්මාණාත්මක හැකියාවන් දියුණු කර ගනියි.
4. යහපත් සිතුවිල්ලෙන් කලාව හා කලාකරුවන් ඇගයීමට ලක්කළ යුතු බවට ප්‍රකාශ කරයි.
5. සෞන්දර්යාත්මක නිර්මාණ විමර්ශනය කිරීමේ හැකියාව ලබයි.
6. යහපත් පුරවැසියෙක් වීමට අවශ්‍ය සමබර පෞරුෂයක් ඇතිකර ගනියි.

# කර්ණාටක සංගීතය - 6 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. දෛනික ජීවිතයට අදාළ සංගීතය විමර්ශනය කරමින් රසවිඳියි | 1.1 එදිනෙදා ජීවිතයේදී සවන්දීමට සිදුවන සංගීතය හඳුනාගෙන රසවිඳියි. | ¨ පරිසරයේ සවන්දෙන සංගීත<br>- නිවෙස් පරිසරය<br>- පාසල් පරිසරය<br>- කුරුල්ලන් හා සතුන්<br>- ස්වභාවයෙන් නිකුත් වන හඬ<br>උදා: ගඟ ගැලීම,සුළං හැමීම, වැස්ස, මුහුදු රළ | ¨ පරිසරයේ ඇසෙන ශබ්ද හඳුනා ගනියි.<br><br>¨ පරිසරයේ ඇසෙන ශබ්ද අධ්‍යයනය කරයි.<br><br>¨ ශබ්දවල විවිධත්වය හඳුනාගෙන එය අනුකරණය කරයි. | 02 |
| | 1.2 දෛනික ජීවිතයට අදාළ සංගීතය රසවිඳියි. | ¨ දෛනික ජීවිතයට අදාළ සංගීතය<br>- ළමා කාලය<br>උදා: වින්නඹු මාතාව විසින් ගයන ලද ගීත, නැළවිලි ගී, ක්‍රීඩා ගී.<br>* මේවායේ වූ විශේෂිත ලක්ෂණ (සංගීතය, අර්ථය, හැඟීම්, වචන භාවිතය, තාලය)<br>¨ දෛනික ජීවිතයට අදාළ සංගීතය<br>- වැඩිහිටි කාලය<br>උදා: රැකියා ගී, නලංගු ගී, ඔංචිලි වාරම්, මරණයක දී ගයන ගී<br>* මේවායේ වූ විශේෂිත ලක්ෂණ (සංගීතය, අර්ථය, හැඟීම්, වචන භාවිතය, තාලය) | ¨ ළමා ගීතවලට සවන්දී රසවිඳියි.<br><br>¨ වැඩිහිටියන් ගයන ගීතවලට සවන්දී රසවිඳියි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 2. සංගීතය සම්බන්ධ නිර්මාණ ඉදිරිපත් කරයි | 2.1 ආදේශක භාණ්ඩ නිර්මාණය කර වාදනය කරයි. | ලු ආදේශක භාණ්ඩ<br>- පත්තේරුව(පියන්වලින් සකස් කළ)<br>- බෙරය (දඬු බෙරය)<br>* භාණ්ඩ රැස් කර ගැනීම<br>* භාණ්ඩ නිර්මාණය<br>ලු සමූහ වාදනය<br>- තම තමන් නිර්මාණය කළ ආදේශක භාණ්ඩ එක්කර සමූහ වාදනයක යෙදීම | ලු පරිසරයෙන් ලබා ගන්නා දේ උපයෝගී කර ගනිමින් ආදේශක භාණ්ඩ නිර්මාණය කරයි.<br>ලු නිර්මාණය කරන ලද ආදේශක භාණ්ඩ උපයෝගී කරගෙන විවිධ අයුරින් වාදනය කරයි. | 04 |
| | 2.2 තමතමන්ගේ හැකියාවන්ට අනුව ගී නිර්මාණය කර හැඟීම්බරව ගායනා කරයි. | ලු ගීත නිර්මාණය, තනු නිර්මාණය<br>ලු අර්ථයට අනුව හැඟීම්බරව ගායනා කිරීම. | ලු කෙටි ගීත නිර්මාණය කරයි.<br>ලු ගීත සඳහා තනු නිර්මාණය කරයි.<br>ලු ගීත අභිරූපණය කරයි. | 03 |
| | 2.3 ස්ව නිර්මාණ ඉදිරිපත් කරයි. | ලු සංගීතය සම්බන්ධ ක්ෂේත්‍ර සටහන් පොත් සකස් කිරීම<br>- සංගීත භාණ්ඩ<br>- සංගීතයට අදාළ කලාකරුවන් | ලු සංගීත භාණ්ඩ හා කලාකරුවන් පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>ලු පොත් නිර්මාණය කරයි. | 02 |
| 3. සංගීත 'උරුප්පඩි' තාලයට ගායනා කරයි | 3.1 ළමා ගීත තාලයට ගායනා කරයි. | ලු 'පාඩිප්පාඩි පලහුවෝම්' | ලු ගීත ඇසුරින් ශංකරාපරණ ස්වරස්ථාන හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>ලු ශංකරාපරණ රාගයට අදාළ ගීත තාලයට ගායනා කරයි. | 05 |
| | 3.2 ජාතික ගීය තාලයට ගායනා කරයි. | ලු ශ්‍රී ලංකා මාතා | ලු ජාතික ගීය, දේශයේ අභිමානය රැකෙන ගීතයක් බව ප්‍රකාශ කරයි.<br>ලු ජාතික ගීය තාලයට ගායනා කරයි. | 05 |
| | 3.3 ජන ගී තාලයට ගායනා කරයි. | ලු 'මන්නැයි නම්බි උලුදු වෛත්නල් | ලු ජන ගී ශ්‍රැතිය, රාගය හා තාලය අනුව ගායනා කරයි. | 05 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.4 ළමා ගීත තාලයට ගායනා කරයි. | ¨ අන්බු නිරෙන්ද පාට්ටි<br>¨ රාගය, තාලය, සංගීතයේ විස්තර | ¨ ළමා ගීත, රාග තාලයට අනුව ගායනා කරයි. | 05 |
| | 3.5 පාසල් ගීය තාලයට ගායනා කරයි. | ¨ පාසල් ගීය<br>රාගය, තාලය, විස්තර | ¨ පාසල් ගීතය ඇසුරින් පාසලේ අභිමානය හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>¨ පාසල් ගීතය ගායනා කරන අවස්ථා ප්‍රකාශ කරයි.<br>¨ පාසල් ගීය ගායනා කරයි. | 05 |
| | 3.6 'තේවාරම්' 'පන්' ඇතිව ගායනා කරයි. | ¨ තෝඩුඩෙය සෙවියන්<br>- පන් - නට්ටපාඩෙයි | ¨ තේවාරම් ගී 'පන්' ඇතිව තාලයට භක්තිවන්තව ගායනා කරයි. | 05 |
| | 3.7 අභ්‍යාස 'උරුපඩි' ශ්‍රැති, රාග, තාල, ඇතිව ගායනා කරයි. | ¨ ස්වර පේළි 1 - 2 සංගීත පුහුණුව | ¨ 'මායාමාලාව ගෞලයි' රාගයට ස්වර පේළි සහිතව ශ්‍රැතියට හා තාලයට ගායනා කරයි. | 02 |
| | 3.8 ගීත කතා තාලයට ගායනා කරයි. | ¨ කුරුවි නිරෙන්ද මරත්තිලේ<br>රාගය, තාලය, විස්තර - සංගීත පුහුණුව | ¨ රාගය හා තාලය ගයයි. | 05 |
| | 3.9 දෙමළ භාෂා ප්‍රශස්ති ගීතය ''(තමිල් මොලි වාල්ත්තුප් පාඩල්)'' තාලයට ගායනා කරයි | .¨ වාල්හ නිරන්දරම් පුහුණුව ලබා ගායනා කිරීම | ¨ දෙමළ භාෂාවේ මහත්වය ප්‍රකාශ කරයි. | 05 |
| | 3.10 ජන ගී තාලයට ගායනා කරයි. | ¨ 'උලක්කෙයි පාඩල්'<br>- ලක්කෙයි ලා ලා කෙ | ¨ ගීතය තාලයට ගායනා කරයි.<br>¨ ජන ගී ඊට ආවේණික වූ තාලයට ම ගායනා කරයි. | 05 |

| | | | | |
|---|---|---|---|---|
| **4. ගීත පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරයි** | **4.1 කර්ණාටක සංගීතයේ මූලික අංග ප්‍රකාශ කරයි.** | ලු පරිභාෂික වචනවල අදහස<br>- සංගීතය - නාදය (මිහිරි ගීත)<br>- ශ්‍රැතිය<br>- ස්වර<br>- ආරෝහණය, අවරෝහණය<br>- තාලය අ<br>- 'දිෂ්ට', 'සදුෂ්ට' අවස්ථා | ලු සංගීතයේ මූලික අංග ගැන ප්‍රකාශ කරයි.<br>ලු සංගීතය, නාදය, ශ්‍රැතිය ගැන පැහැදිලි කිරීමක් කරයි.<br>ලු ස්වර, ආරෝහණ අවරෝහණ ගැන පැහැදිලි කරයි.<br>ලු තාලය යන්න නිර්වචනය කරයි.<br>ලු 'දිෂ්ට', 'සදුෂ්ට' යන්න නිර්වචනය කරයි. | 19 |
| **5. සංගීතය මුල් කර ගත් සමාජයීය, සංස්කෘතික, පාරම්පරික ලක්ෂණ ප්‍රකාශ කරයි.** | **5.1 ආගමික, සංස්කෘතික අවස්ථා පිළිබඳ කලාත්මක අංග ඉදිරිපත් කරයි.** | ලු තෛපොංගල් පිළිබඳ කලාත්මක අංග<br>ලු වෙසක්, රාමසාන්, සම්බන්ධ කලාත්මක අංග<br>ලු නත්තල් උත්සවයේ කලාත්මක අංග | ලු විවිධ වූ උත්සවවල කලාත්මක ලක්ෂණ අධ්‍යයනය කරයි. | 08 |